**ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

1.1 **තත්ත්වාගණනය නොකළ මතය**

------------------------------------

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව2021 ජූනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 14 දිනගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශවලින් 2020 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

**---------------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කරක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවාදූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනයපිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තා**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වියදම් ඇස්තමේන්තුවට අමතරව මුදල් රෙගුලාසි 66වීරමොං ක්‍රියාපටිපාටිය යටතේ අමතර ප්‍රතිපාදන එකතු කරගෙන තිබුණද මුදල් රෙගුලාසි 94(1) පටහැනිව පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා ප්‍රතිපාදන ඉතිරිවීම් ඉක්මවා රු.144,244 ක් බැරකම්වලට බැදී තිබුණි. | 2020 වර්ෂය තුළ අතුරු සම්මත ගිණුම් 04ක් සම්මත වීම් මත ප්‍රතිපාදන හා වියදම් පාලනය උපරිම ලෙස පවත්වාගෙන ඇත. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳීමට කටයුතු නොකළ යුතු බව. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ විශ්‍රාම වැටුප් ලබමින් සිටි ගම්පහ දිස්ත්‍රිකය තුළ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක විශ්‍රාමිකයන් 72 දෙනෙකු මියගිය බව දැනුම් දීමට ප්‍රමාද වීම හේතුවෙන් ඔවුන් මිය යාමෙන් පසුව 2020 දෙසැම්බර් 31 දිනට රු.9,539,450ක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙම වැඩිපුර ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කිරීම හා අදාළ ක්‍රියාමාර්ග ගැනීම විශ්‍රාම වැටුප් ජනරාල්ගේ වගකීමක් වේ.කෙසේ වෙතත් පසුගිය වසර 10 තුළ මාගේ අධීක්ෂණය යටතේ ප්‍රධාන ගණකාධිකාරීගේ මෙහෙයවීමෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ට හා ගණකාධිකාරීවරුන්ට අවශ්‍ය උපදෙස් ලබා දෙමින් මෙම වැඩිපුර ගෙවන ලද මුදල් සෑහෙන ප්‍රමාණයක් අයකරගෙන ඇති බව දන්වනු කැමැත්තෙමි. | ප්‍රාදේශීය ලේකම්වරයාගේ සෘජු අධීක්ෂණය මේ සම්බන්ෂයෙන් යොමු කළ යුතු වීම සහ වැඩිපුර ගෙවීම් ආපසු අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |

## 2.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|
| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| (අ) | 2017 ජූලි 03 දිනැති අංක 130/09/14/8 දරන ජාතික අයවැය චක්‍රලේඛය | කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරුන් දෙදෙනෙකු සහන පදනම මත යතුරුපැදි ලබාගෙන තිබුනද වයස 60 සම්පූර්ණ වීමට පෙර විශ්‍රාම යාම නිසා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ඔවුන්ගෙන් රු.283,420ක් ආපසු අය කර ගත යුතු වුවත් වසර 3 කට වඩා වැඩි කාලයක් ගතවී ඇතත් එම මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අයවිය යුතු යතුරුපැදි මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | අය විය යුතු මුදල චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව නොපමාව අය කර ගත යුතු වීම. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදය 13(3)වගන්තිය**.** | වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත් වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිළධාරීන් 13 දෙනෙකු මාස 9 සිට මාස 44 දක්වා කාලයක් වැඩ බැලීම් කර තිබුණි. | ග්‍රාම නිලධාරී වසම් 13ක පුරප්පාඩු පැවතීම නිසා අදාල වසම් 13 සඳහා වැඩ බැලීම් සඳහා පත් කිරීමට සිදුව ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | වැඩ බැලීමේ තනතුරු සඳහා නොපමාව නිත්‍ය පත්වීම් ඇති කළ යුතු වීම. |
| **(ඇ)** | ශ්‍රී ලංකාප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ | | | |
| | **(i)** මුදල්රෙගුලාසි 1647(ඉ) | ආයතනය සතු වාහන පිළිබඳව වාහන අංකය, චැසි අංකය, එන්ජින් අංකය, අශ්ව බලය, ඉන්ධන වර්ගය, වාහන වර්ගය, මාදිලිය, මිලට ගන්නා ලද්දේ නම් මිලට ගත් දිනය, ගෙවූ මුදල, ගෙවූ දිනය, ආරක්ෂණ සහතිකය ආදිය පිළිබද විස්තර ඇතුලත් විධිමත් වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. | විගණනය මගින් පෙන්වා දී ඇති කරුණුවලට අනුව අදාළ ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන යායුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | **(ii)** මුදල් රෙගුලාසි 1647(ඉ) | වාහන තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අදාල ලේඛනය පිළියෙල කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව අදාල ලේඛනයක් පවත්වා ගැනීම. |
| **(ඇ)** | 2011 මාර්තු 30 දිනැති 1/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාම වැටුප් පාලන ගිණුමක් පිළියෙල කර පවත්වාගෙන ගොස් නොතිබුණි | විගණනය මගින් පෙන්වා දී ඇති කරුණුවලට අනුව අදාළ ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | 2011මාර්තු 30 දිනැති 1/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2.4** **අවිධිමත් ගනුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයවිසින් විධිමත් අනුමැතියකින් තොරව පහත සඳහන් ගනුදෙනුව කර තිබුණි.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වැය විෂය අංක 256-1-2-0-1001 යටතේ ගිණුම්ගත කර ඇති රු.3,200,000 ක් හා රු.500,000 ක් ජ'නල් සටහන් මගින් පිළිවෙලින් 256-1-2-0-1003 සහ256-1-1-0-1001 වැය විෂයයන්වලට මාරු කර තිබුණ ද ඒ සඳහා වූ විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබිණි. | 2020 වර්ෂය තුළ අතුරු සම්මත ගිණුම යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ඌනතාවය හා අතිරික්තය ගලපා ගැනීම සඳහා පුද්ගල පඩි නඩි අතර මාරු කිරීමට අවස්ථාව සලසා තිබූ බව | මාරු කිරීම් සඳහාවිධිමත් අනුමැතියක් ලබා ගත යුතු බව. |

**2.5** **වංචනික ස්වරූපයේ ගනුදෙනු**

---------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2014 ජූලි 15 දින සිදු වූ සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1)(ආ) ප්‍රකාරව සිදු කරන ලද අවසන් වාර්තාව අනුව මෙම මුදල් අස්ථානගත වීම සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම්, ගණකාධිකාරි, මුදල් සහකාර සහ | 2021 මැයි දෙවන දින ලබාදී ඇති පරීක්ෂණ වාර්තාව පිළිබඳව ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කර ඇත. ඒ අනුව ඔහු විසින් ලබාදෙන උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. | අයකිරීම් කඩිනමින් කළ යුතු බව |

සරප් යන නිලධාරින්ගේ රාජකාරි කටයුතුවල පැවති අඩුපාඩු, නොසැලකිලිමත් බව සහ අනවධානය හේතු වී ඇති බැවින් මෙමගින් රජයට සිදු වූ අලාභය එම නිලධාරින් හතර දෙනාගෙන් අයකර ගත යුතු බවට පරීක්ෂණ කමිටුව විසින් යෝජනා ඉදිරිපත් කර තිබුණි.

ඒ අනුව 2020 සැප්තැම්බර් 22 දිනැති ලිපියෙන් එම අය කිරීම සඳහා නිර්දේශ හා අනුමැතිය ලබා දී තිබුණ ද අදාල අයකිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ තිබියදී ගම්පහ දිස්ත්‍රික් ලේකම්වරයාගේ 2020 ඔක්තෝබර් 05 දිනැති ලිපිය පරිදි"විනය නියෝගයන් හි වෙනස් වීම යන කාරණය" මත පදනම්ව නැවත සමාලෝචන පරීක්ෂණයක් සිදු කර වාර්ථාවක් කැඳවා තිබුණි. එලෙස වාර්තාවක් කැඳවීමේ අවශ්‍යතාවය කුමක් ද යන්න පැහැදිලි කර නොතිබුණි. මුදල් සහකාර හා සරප් යන නිළධාරීන්ට මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි පූරණය කර ගැනීම සඳහා මේ වන තෙක් දී ඇති කිසිඳු නියෝගයක සංශෝධනයක් අභියාචනා අනුව ලබා දී නොතිබිය දී අදාළ අයකිරීම් කඩිනමින් සිදුකරීමට කටයුතු කර නොතිබුණි

## 2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,236,665 ක් විය. එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 5 ට වැඩි කාල පරාසයක සිට පැවත එමින් තිබුණු නමුත් එම ශේෂ අයකර ගැනීම සඳහා පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. | අයවිය යුතු ණය ශේෂවලින් රු.4,236,665 ක් මිය ගිය, විශ්‍රම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගේ බව පිළිගන්නා අතර එම ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධව ප්‍රදේශීය ලේකම් කාර්යාලවලට නිරන්තර උපදෙස් ලබා දෙනු ලැබේ. | අය කර ගත හැකි විකල්ප ක්‍රියාමාර්ගවලින් අය කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම |

## 2.7 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පොදු තැන්පත් ගිණුම් 03ක අවස්ථා 1150 කදී තැන්පත් කරන ලද, වර්ෂ දෙකකට වඩා කල් ඉකුත් වූ වටිනාකම රු.298,476,498ක් වූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. ඉන් එක් තැන්පත් ගිණුමක පවතින රු.20,651,041 ක් වූ තැන්පතු මුදල ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක කල් ඉකුත් වූ කොන්ත්‍රාත් 367ක් වෙනුවෙන් තබා ඇති රඳවුම් මුදල් වන අතර එම ශේෂ සම්බන්ධයෙන්ද සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එකඟ වේ.<br>පොදු තැන්පත් ගිණුමේ ශේෂ නිරවුල් කිරීම සඳහා පසුගිය වර්ෂ කිහිපය තුලම විධිමත් වැඩපිළිවෙලක් සකස් කර බොහෝමයක් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර ඇති බව දන්වමි. එසේම වන්දි ගෙවීම් නිරවුල් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් යොදා ඇති අතර අධිවේගී මාර්ග සඳහා අත්පත් කර ගැනීම් යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවීම නිසා ලබා නොගත් වන්දි මුදල් වැඩි ප්‍රමාණයක් මෙම මුදල නියෝජනය වන අතර එම එකඟතාවයන් ලැබෙන තෙක් අදාල වන්දි මුදල් තැන්පත් ගිණුමේ රඳවා ගැනීමට සිදුවේ. තවද ඉඩම් ආරවුල්, වන්දිලාභීන් විදේශගතවීම් ආදී හේතු මත මෙම වන්දි මුදල් නිරවුල් කිරීම ප්‍රමාද වීම සිදුවේ. කෙසේ වෙතත් මෙම තැන්පතු ශේෂ 2021 වර්ෂය තුල හැකිතාක් නිරවුල් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පතු ශේෂය නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතු වීම |

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 0007041718 දරන බැංකු ගිණුමට අදාළව 2020 දෙසැම්බර් 31 වන විට රු.19,447 ක් වටිනා චෙක්පත් 24 ක් උපලබ්ධි වී නොතිබුණ අතර එම චෙක්පත් 2014 ජූලි 14 දින සිට පැවත එන වටිනාකම බව නිරීක්ෂණය විය. | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාල 2020 දෙසැම්බර් මාසයේදී උපලබ්ධි නොවූ චෙක්පත් වටිනාකම වූ රු.17,206,056ක මුදලම 2021.03.31 වන විට නිරවුල් වී ඇත. | මේවන විටද නිරවුල් නොවී පවතින රු. 19,447ක්වටිනා චෙක්පත් සඳහා ලැබිය යුතු මුදල්, මුදලින්ම අය කරවා ගත යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 සැලැසුම් කිරීම**

---------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් 37 ක් තුල නිල සෙවන කාර්යාල 27 ක් ඉදිකිරීමට බලාපොරොත්තු වූවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව රජයේ ඉඩම් හෝ පරිත්‍යාග ඉඩම් නොමැති වීම නිසා ඉදිකර ඇති නිල සෙවන කාර්යාල 09 කට සීමා කර තිබුණි. ඒ අතුරින් එක් කාර්යාලයක 2013 වර්ෂයේ සිට සනීපාරක්ෂක පහසුකම් හා ජල පහසුකම් නොතිබුණු අතර එක් කාර්යාලයක 2018 වර්ෂයේ සිට සනීපාරක්ෂක පහසුකම් නොමැතිව පවත්වාගෙන ගොස් තිබුණි. එම පහසුකම් සපයා දීමට සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි. | සේවා පියස සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය තුලින් වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමා තුල ඉදිකිරීම් කටයුතු කරනු ලබන අතර එම සීමාව තුළ බොහෝ කාර්යාල තම සියලු අවශ්‍යතා සම්පූර්ණ කර පවත්වාගෙන යනු ලැබේ. අඩුපාඩු අනාවරණය වූ විට එම අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සියල්ල වෙන් කර ඇත. රජය සතු ඉඩම් වල මෙම ඉදිකිරීම් කරනු ලබන අතර එවැනි ඉඩම් යොදා ගත හැකි නම් හෝ පරිත්‍යාගශීලියෙක් යම් ඉඩමක් පරිත්‍යාග කරන අවස්ථාවේ එම ඉදිකිරීම් කරනු ලැබේ. ගම්පහ දිස්ත්‍රික්කය තුළ සීමිත රජයේ ඉඩම් ප්‍රමාණයක් උපයෝගී කර ගනිමින් හැකිතාක් දුරට ඉදිකිරීම් සිදුකර ඇත. | සැලසුම් සකස් කිරීමේදී ඒ සඳහා පවතින භෞතික සම්පත් පිළිබඳව අවධානය යොමු කරමින් සිදුවන අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

------------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අත්තනගල්ල හා මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලබාගත් තොරතුරු අනුව ආසියානු සංවර්ධන බැංකුව, නාගරික සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ප්‍රජා ජල යෝජනා ක්‍රම මගින් ලබාදුන් රු. මිලියන 47.37 ක ප්‍රතිපාදන වැයකර ඉදිකරන ලද ජල ව්‍යාපෘති 11 ක් මේවනවිට අක්‍රීය තත්ත්වයට පත් වී තිබුණි. ඒ හේතුවෙන් එම ව්‍යාපෘති මගින් ප්‍රතිලාභ ලැබූ | ව්‍යාපෘති පිළිබඳ සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ. | ජල ව්‍යාපෘති අක්‍රිය වීමට බලපා තිබෙන හේතු නිවැරදි කර මහජනයාට ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතු වීම. |

ප්‍රතිලාභී පවුල් 1257 ක් පමණ ජලය ලබාගැනීමේදී විවිධ ගැටළුවලට මුහුණපා සිටින බවත් මෙම ව්‍යාපෘති නැවත යථා තත්ත්වයට පත්කර ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කර නොමැති බවත් නිරීක්ෂණය විය.

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 06 දිනැති අංක 01/2019 දරන මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කළ සපිරිගමක් වැඩසටහන යටතේ ග්‍රාමීය පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කළහැකි ක්ෂේත්‍ර 09 ක් හඳුන්වා දී තිබුණි. නමුත් කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉටු කරන ලදව්‍යාපෘති 71 ක් අතුරින් ව්‍යාපෘති 67 ක පමණ ග්‍රාමීය මාර්ග, පඩිපෙල, බෝක්කු, කුඩා පාලම් හා පැති කාණු සෑදීම කෙරෙහි පමණක් අවධානය යොමු කර තිබුණි. එසේම, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ක්ෂේත්‍ර 03 ක් යටතේ ව්‍යාපෘති 426 ක් අනුමත වී තිබුණි. 2020 වර්ෂය සඳහා ව්‍යාපෘති තෝරා ගැනීමේදී ග්‍රාමීය මාර්ග සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබුණු අතර අනුමත ව්‍යාපෘතිවලින් 413 ක් හෙවත් සියයට 96 ක් එම ක්ෂේත්‍රයේ ව්‍යාපෘති විය. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශවල පවතින අනිකුත් ක්ෂේත්‍ර සම්බන්ධව ගැටළුවලට විසඳුම් මෙමගින් ඉටු වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | සපිරිගම වැඩසටහනට අදාලව, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් 2019 දෙසැම්බර් 06 දින නිකුත් කරන ලද අංක 01/2019 දරණ සංවර්ධන චක්‍රලේඛය ප්‍රකාරව, සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම හා ප්‍රමුඛතා ගත කිරීම ප්‍රාදේශීය දේශපාලන නියෝජිතයින්ගේ හා ප්‍රාදේශීය/ග්‍රාමීය රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්ව ඇතුව ග්‍රාමීය ප්‍රජාවගෙන් සැදුම්ලත් "ග්‍රාමීය කමිටුවක්" මගින් සිදු කරන ලදී. ඒ අනුව ග්‍රාම නිලධාරී වසම්වල ග්‍රාමීය කමිටුව විසින් ප්‍රමුඛතා ගත කර නිර්දේශ ලබා දුන් ව්‍යාපෘති මෙහිදී සිදු කරන ලදී. | ලැබෙන ප්‍රතිපාදන මගින් චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල වන ලෙස සහ මහජනයාට උපරිම සේවයක් ලැබෙන පරිදි ව්‍යාපෘති තෝරා ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 වර්ෂයේදීමීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මීනුවන්ගොඩ නාලන්දා පිරිමි පාසලෙහි නල ළිඳක් ඉදිකර ජල පොම්පාගාරයක් සවිකර පානීය ජලය ලබා දීම සඳහා රු.1,000,000 ක ඇස්තමේන්තුගත මුදලකට ව්‍යාපෘතියක් ආරම්භ කර රු.800,714 ක වියදමක් දැරීමෙන් පසු අපේක්ෂිත ප්‍රතිලාභ ඉටු නොවීම මත ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | 2020 වර්ෂය තුළදී ක්‍රියාත්මක වූ ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ ගැටළු හා යම් ක්‍රියාත්මක කිරීමේ අපහසුතා නිසා නවතාලීමට සිදු වී ඇත. | ලැබෙන ප්‍රතිපාදන මගින් මහජනයාට උපරිම සේවයක් ලැබෙන පරිදි ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළ යුතු බව |
| (ආ) 2020 වර්ෂය තුල දී ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ මීරිගම, අත්තනගල්ල සහ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ඇස්තමේන්තුගත පිරිවැය රු.2,150,000 ක් වූ ව්‍යාපෘති 4 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ නිල සෙවන ව්‍යාපෘති කාර්යාල 15ක් ඉදි කිරීමට සැලසුම් කර තිබූ නමුත් කාර්යාල 8 ක් පමණක් නිමකර තිබූ අතර ඉතිරි ව්‍යාපෘති 7 සඳහා 2018 වර්ෂයේදී රු.1,433,909 ක් වියදම් දරා අතහැර දමා තිබුණි. 2020 වර්ෂයේදී ඒවායේ ඉදිකිරීම් නිම කිරීම සඳහා රු.12,566,092 ක ප්‍රතිපාදන ලබා ගැනීමට සැලසුම් කර තිබුණු නමුත් ප්‍රතිපාදන ලැබී නොතිබුණි. | -එම- | -එම- |

**3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 06 දිනැති අංක 01/2019 දරන සංවර්ධන චක්‍රලේඛය ප්‍රකාරව අනුමත සියළුම ව්‍යාපෘති 2020 නොවැම්බර් 30 දිනට පෙර නිමකරනු ලබන බවට දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වගබලාගත යුතු බව සඳහන් කර තිබුණි.එහෙත් 2020 වර්ෂය සඳහා ග්‍රාමීය මාර්ග සංවර්ධනය යටතේ අනුමත වී ඉටු කිරීම සඳහා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දිවුලපිටිය ප්‍රාදේශීය සභාව සමග ගිවිසුම්ගත වී තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.52,288,000 ක්වූ ව්‍යාපෘති 95 ක් වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | 2020 සපිරි ගමක් වැඩසටහන යටතේ ප්‍රාදේශීය සභා බලධාරීත්වයෙන් ව්‍යාපෘති 413ක් අනුමත වුවද 2020.12.31 වන විට වැඩ අවසන් කල ව්‍යාපෘති 95ක් ක්‍රියාත්මක නොකිරීමට හේතු විමසමින් 2021 පෙබරවාරි 02 දින ප්‍රාදේශීය සභාවට ලිපියක් යැවූ අතර මෙම ලිපිය ප්‍රකාරව වැඩ අවසන් කිරීමට නොහැකි වීමට පහත හේතු දක්වා තිබුණි.<br>• රටේ පවතින කොරෝනා රෝගී තත්ත්වය<br>• රට යථා තත්ත්වයට පැමිණිය පසු ඉතිරිව තිබූ කාලය තුල කළ යුතු ව්‍යාපෘති ප්‍රමාණය අධික වීම.<br>• 2020.10.04– 2020.11.09 දක්වා බල ප්‍රදේශ නැවත වරක් වසා දැමීම<br>• අධික වර්ෂාව<br>• මාර්ග ව්‍යාපෘති කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමෙන් තොරව දෙපාර්තමේන්තු ක්‍රමයට ක්‍රියාත්මක වීම. | ගිවිසුම්ගත කාලය තුල ව්‍යාපෘතීන් නිම කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | සපිරි ගමක් ජනතා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ 2020 වර්ෂය තුළ ඉටු කර නොතිබූ රු**.** 33,100,000 ක ව්‍යාපෘති 48 ක් අවිච්ඡේද ව්‍යාපෘති වශයෙන් 2021 වර්ෂයට ගෙන තිබුණු අතර 2021 මාර්තු 31 දින වන විටත් ව්‍යාපෘති සියල්ල නිමකර නොතිබුණි. | සපිරිගම අවිච්ඡේද ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය හා ප්‍රතිපාදන ලැබී ඇති අතර එම ව්‍යාපෘති කඩිනමින් අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | ගිවිසුම්ගත කාලය තුල ව්‍යාපෘතිනිම කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනට | ජා - ඇල ප්‍රාදේශීය ලේකම් | උද්ධමනකාරී |

| | | | |
|---|---|---|---|
| | පවතින ගොඩනැගිල්ල ඉතාම අබලන් තත්වයේ පවතින බැවින් නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම 2013 වර්ෂයේ ආරම්භ කරරු. මිලියන 165.34 ක ඇස්තමේන්තු මුදලකට හැකි ඉක්මනින් ඉදිකර අවසන් කිරීමට බලාපොරොත්තු වී තිබුණි. නමුත් ඉඩම පිළිබඳ මතුවූ ගැටළුකාරී තත්වයන් හේතුවෙන් සිදු වූ කාල පමාවකින් පසු පාදම ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා රු.5,369,779 ක අත්තිකාරම් මුදලක්ද ගෙවීමෙන් පසු කොන්ත්‍රාත්තුවේ වැඩ තාවකාලිකව අත්හිටුවා තිබුණි. පසුව වසරකට ආසන්න කාලයකින් පසු එම ආයතනය මගින්ම රුපියල් මිලියන 27 ක් වැය කර පාදම කොටස ඉදිකර රු.මිලියන 145.33 වටිනාකමකට ඉතිරි වැඩ කොටස වෙනත් ආයතනයකට පවරා තිබුණි. නමුත් ඉදිකිරීම් සිදුවන අවස්ථාව වන විටද රුපියල් මිලියන 60 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ගෙවා ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර භූමිය පිහිටීම සහ අයිතිය පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව කටයුතු කිරීම නිසා මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට ද නිමකර ගැනීමට නොහැකි වී තිබුණි. | කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු සඳහා ඇක්සස් ආයතනයට භාරදී තිබූ අතර ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් වෙනත් භූමියක් තෝරා ගැනීමට පසුව උත්සහ කළ නිසා ඉදිකිරීමේ යම් ප්‍රමාදයක් සිදු වුවත් එම ආයතනය විසින් තෝරාගත් නව ඉඩමේ මෙම කටයුතු ආරම්භ කර අවසන් කරන ලදී. අත්තිකාරම් ගෙවීම සඳහා අත්තිකාරම් බැදුම්කර ලබා ගෙන තිබූ අතර මෙම වෙනස් වීම මත කිසිදු අමතර අත්තිකාරම් මුදලක් ගෙවා නොමැති අතර ඉදිකිරීම් කටයුතු සාර්ථකව කරගෙන යනු ලැබේ. | තත්ත්වයන්ට හසු නොවන ආකාරයට, ගිවිසුම්ගත කාල සීමාවන් තුළදී ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු බව. |
| (ඈ) | කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වර්ෂයක් පාසා නිරන්තර ගංවතුර අවධානම් තත්ත්වයකට පත්වන හේතුන් ලෙස පවත්නා ඇල මාර්ග, කාණු හා බෝක්කුවල අවහිරතා ඉවත් නොකිරීම, ජලය බැස යාම ප්‍රමාණවත්ව සිදු නොවීම හා ඒවා නිසි නඩත්තුවකට ලක් නොවීම යනාදී කරුණු හඳුනාගෙන තිබුණි. ඒවාට පිළියම් වශයෙන් ආපදා කලමණාකරණ මධ්‍යස්ථාන විසින් විවිධ ව්‍යාපෘති 18 ක් හඳුනාගෙන තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වගකීම වනුයේ ගංවතුර පාලනය සඳහා අවශ්‍ය ව්‍යාපෘති හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතන දැනුවත් කිරීම වේ.ඒ අනුව අදාල අවහිර වූ ඇල මාර්ග හඳුනාගෙන අදාල වර්ෂය තුළ ආපදා කළමණාකරන ඒකකය දැනුවත් කර ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | මහජනයාට උපරිම සේවයක් ලැබෙන පරිදි ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය |

**3.6** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කෙටුම්පත් කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය කාර්යසාධන වාර්තාව දින 150ක් තුල ඉදිරිපත් කළ යුතු අතර මූලික කෙටුම්පත දැනටමත් ඉදිරිපත් කර ඇති අතර අවසන් විගණන වාර්තාව ලැබුණු පසු මුද්‍රණය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් සහ මාර්ගෝපදේශ ප්‍රකාරවකෙටුම්පත් කාර්යසාධන වාර්තාවඉදිරිපත් කළ යුතු බව. |

**3.7** **වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 වර්ෂයේදී ප්‍රාදේශිය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ විමධ්‍යගත අයවැයෙන් වෙන් කරනලද රු.ලක්ෂ 50 ක මුදලකට කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් දිප්පිටිගොඩ සේවා පියස ඉදිකර තිබුණි. එම ගොඩනැඟිල්ලෙහි ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘද්ධි නිලධාරී හා කෘෂි නිලධාරී යනාදී සියලු නිලධාරීන් රාජකාරී කටයුතු කළ යුතු වුවත් ගොඩනැඟිල්ල ඉදිකර වසර 02 කට අධික කාලයක් වුවද ප්‍රාදේශීය සභාවට අයිති භූමියක ඉදි කිරීම නිසා ඉහත කී නිලධාරීන්ට එම සේවා පියසෙහි රාජකාරී කටයුතු කිරීමට ප්‍රාදේශීය සභාව විසින් ඉඩ ලබාදී නොතිබුණි. | එකග වේ. | ගොඩනැගිලි ඉදිකිරීමට ප්‍රථම අයිතිය පිළිබඳ අවධානය යොමු කළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 වර්ෂයේදී මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල සෙවණ කාර්යාල 11 ක් ඉදිකර ඇති අතර මේවා ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරී, සමෘද්ධි නිලධාරී වැනි මහජන සම්බන්ධතා පවතින නිලධාරීන්ගේ භාවිතය සඳහා යොදා ගැනුනද මෙම කාර්යාල සඳහා ජලය හා විදුලිය පහසුකම් නොමැති අතර කාර්යාල දෙකක නිලධාරීන් සඳහා ස්ථාන වෙන්කිරීම්ද සිදුකර නොතිබුණි. | 2017 වර්ෂයේ දී නිල සෙවන කාර්යාල 11 ඉදිකිරීම සඳහා එක් කාර්යාලයක් වෙනුවෙන් රු2,000,000 ක ප්‍රතිපාදනයක් ලබා දෙන ලදී. එහිදී රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මගින් ලබා දී තිබූ සැලැස්මට අනුව ඇස්තමේන්තු සකස් කිරීමේදී සිදු කළ හැකි වැඩ කොටස් වූයේ ගොඩනැගිල්ල කොටස් හතරකට වෙන්කිරීම හා පිටතින් වැසිකිළියක් ඉදිකිරීම පමණි. විදුලිය හා ජල අවශ්‍යතා සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලුම් කරන ලද සෑම අවස්ථාවකදීම ප්‍රතිපාදන සීමාව තුල ලබා දී ඇත. | ලැබෙන ප්‍රතිපාදන මගින් උපරිම සේවයක් සැලසෙන පරිදි ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු බව. |

## 3.8 දේපල පිරියත සහ උපකරණ

--------------------------------

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------------- | ----------- |
| (i) | මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු භූමිය සඳහා ඔප්පුවක් නොමැතිවීම හේතුවෙන් එහි වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.එසේම, ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් කරන ලද තහවුරු කිරීම් අනුවකටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල අයත් භූමිය රු.15,000,000 කට තක්සේරු කර ගිණුම්ගත කර තිබුණ ද එම ඉඩමෙහි අයිතිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වී තිබුණි. බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල අයත් භූමියෙහි වටිනාකම රු.28,000,000ක්ලෙස ගිණුම්ගත කර තිබුණ ද, එම ඉඩමෙහි වටිනාකම තක්සේරු කර නොතිබුණි. | මේ පිළිබඳව භාණ්ඩාගාර ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් සමඟ පැවති රැස්වීම්වලදී නිරන්තරයෙන් සාකච්ඡා කර ඇති අතර මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් තක්සේරුදෙපාර්තමේන්තුවට ලිඛිතව ද දන්වා ඇත. ඉඩමේ ඔප්පුව පිළිබඳ ගැටළු නිසා තක්සේරු දෙපාර්තමේන්තුව මෙම තක්සේරුව සිදුකර නොමැත.මේ පිළිබඳව නැවත වරක් අදාළ තක්සේරුකරුවන් සමඟ සාකච්ඡා කර 2021.12.31ට ප්‍රථම අදාළ කටයුත්ත අවසන් කිරීමට බලාපොරොත්තු වේ. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වීම සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට හිමිකාරත්වය නොමැති දේපල පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් හෝ ප්‍රාදේශීය ලේකම් බලධාරීත්වය යටතේ ඉදිකරන ලද දිවුලපිටිය, වත්තල, කටාන, ගම්පහ, අත්තනගල්ල, ජා ඇල සහ දොම්පෙ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සේවා පියස/ නිල සෙවන කාර්යාල 97ක ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සේවා පියස/නිල සෙවන කාර්යාලවල ගොඩනැගිලි තක්සේරු කිරීමේදී එම ඉඩම්වල අයිතිය පිළිබඳ ගැටළු නිසා තක්සේරු කිරීමට නොහැකි වී ඇත. මෙම ඉඩම්වලින් බොහොමයක් ඉඩම් ප්‍රාදේශීය සභාව සතුවීම නිසා තක්සේරු කිරීමට නොහැකි වී ඇති බව දන්වමි. නිශ්චිතව දිස්ත්‍රික් ලේකම් සතුව නොමැති ජංගම නොවන වත්කම් ගිණුම්ගත කිරීම ගැටළු සහගත වන බැවින් මේ පිළිබඳව භාණ්ඩාගාර ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡාකර නිසි වැඩ පිළිවෙළක් යෙදීමට කටයුතු කරමි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවීම. |

**3.9** **පාඩු හා හානි**

**--------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් අංක 251- 3437 දරන කැබ් රථයට1999 වර්ෂයේ ජූලි මස සිදු වූ අනතුර හේතුවෙන් රක්ෂණයෙන් අයකර ගත නොහැකි අලාභය රු.189,360 ක් විය. ඒ සඳහා සිදු කරන ලද ප්‍රාරම්භක වාර්තාවේ නිර්දේශ අනුව අනතුර සිදු කළ වෑන් රථයේ රියදුරු මේ සඳහා වගකිව යුතු විය. ඒ අනුව අදාළ රියදුරුට එරෙහිව නෛතික කටයුතු ආරම්භ කර ඇතත් 2021 ජනවාරි 22දිනවනවිටත් එම නඩුවෙහි ඉදිරි කටයුතු සිදු නොවීම නිසා අදාල අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | එකඟ වේ. | අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතු බව |

## 3.10 කළමනාකරණ දූර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නඩත්තු කර ඇති සම්පත් පැතිකඩ තොරතුරු ඔස්සේ ලබාගත් සංඛ්‍යා අනුව දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජීවත්වන පවුල් සංඛ්‍යාව 43,518 ක් වන අතර එම පවුල්වලින් අනවසර නිවාසවල ජීවත් වන පවුල්279ක් ද තාවකාලික නිවාස 504 ක් ද, වැසිකිලි පහසුකම් නොමැති 530 ක් ද මාර්ග පහසුකම් නොමැති 269 ක් දපොදු ජල කරාම භාවිතා කරන 266 ක් ද විදුලිය නැති නිවාස 372 ක් ද වශයෙන් අවම පහසුකම්වත් නොමැතිව ජීවත් වන විශාල පිරිසක් සිටින බව නිරීක්ෂණය විය. | නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා “ඔබට ගෙයක් රටට හෙටක්” තේමාව යටතේ යටතේ දිවුලපිටිය කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසමකට 1 නිවසක් බැගින් ග්‍රාම නිලධාරි වසම් 122 ක් සඳහා නිවාස 122 සෑදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාක්මක කරනු ලබයි.වැසිකිලි පහසුකම් නොමැති අය සඳහා විවිධ වැඩ සටහන් යටතේ ආධාර ලබා දීමේ කටයුතු සිදු කරමින් පවතී. ග්‍රාම නිලධාරි වසම් 123 ටම ජලය ලබා ගැනීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් පවතී.මාර්ග පහසුකම් නොමැති අය සඳහා මාර්ග කි.මී. ලක්ෂයක් ඉදිකරීමේ ව්‍යාපෘති හි අයිරෝඩ් ව්‍යාපෘති මාර්ග සංවර්ධන අධිකාරිය 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන අතර දිවුලපිටිය ප්‍රාදේශීය සභාව විසින්ද ග්‍රාමීය මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.විදුලිය නොමැති සියළු පවුල් සඳහා විදුලිබල අමාත්‍යාංශය මගින් අප්‍රේල් මාසය සඳහා විදුලිය ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතී. | අවම පහසුකම් නොමැතිව ජීවත්වන අය නගා සිටුවීම සඳහා විශේෂ අවධානය යොමුකල යුතු බව |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය වනවිට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 487ක් පැවති අතර එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට ඒ සම්බන්ධයෙන් අධිකාරිය තිබෙන අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛ 04/2017 අනුව සෑම කාර්තුවක් අවසානයේම කාර්ය මණ්ඩලය පිළිබඳ වාර්තාවක් මාර්ගගත ක්‍රමය ඔස්සේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කර ඇත. පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නිළධාරීන් අනුයුක්ත කරන ලෙස, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇති බව කාරුණිකව දන්වමි. ඒ අනුව ඉදිරියේදී අදාල බඳවාගැනීම් සිදු කිරීමෙන් පසු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට බලාපොරොත්තු වේ. මේ සම්බන්ධ පුරප්පාඩු තනතුරු සඳහා නවක නිලධාරීන් පත්කිරීමේ බලය මා සතුව නොමැති බව වැඩිදුරටත් දන්වමි. | අදාළ අත්‍යාවශ්‍යය පුරප්පාඩු පිරවීමට කටයුතු කලයුතු වීම |